**ශ්‍රී ලංකා විදේශ කටයුතු අමාත්‍ය පා.ම. ගරු මංගල සමරවීර මහතා විසින් කරන ලද කථාව**

**මහලේකම්වරයාගේ මුලිකත්වයෙන් ආරම්භකරන ලද සාමය ගොඩනැගීමේ අරමුදල වෙනුවෙන් අරමුදල් ලබාදීමේ සම්මේලනය**

**2016 සැප්තැම්බර් 21 නිව්යෝර්ක් හි දී**

**උතුමාණෙනි,**

**සුවිශේෂී නියෝජිතවරුනි,**

- මහලේකම්වරයාගේ සාමය ගොඩනැගීමේ අරමුදල සඳහා යළි අරමුදල් සැපයීම සඳහා වූ ප්‍රතිඥාදීමේ සමුළුව වෙනුවෙන්, කෙන්යාව, මෙක්සිකෝව, කොරියානු ජනරජය, නෙදර්ලන්තය, සෝමාලියාව, ස්වීඩනය සහ එක්සත් රාජධානිය යන රටවල් සමඟ සහ සම්බන්ධව සමසත්කාරකත්වය ලබාදීමට ලැබීම මාගේ ඉමහත් සතුටට හේතු වේ.

- 2006 වසරේ ආරම්භ කරන ලද දින සිට, අරගලවලින් අත් මිදීම සඳහා මෙන්ම උදාකරගත් සාමය තිරසාර කිරීම සඳහා පහසුකම් සැපයීමෙන් ද මෙම අරමුදල බොහෝ රටවලට සිය සහයෝගය ලබා දී ඇත. අර්බුද පැතිරීයාම, උග්‍රවීම සහ යළි යළිත් සිදුවීම වැළැක්වීම වෙනුවෙන් හා ඒවායේ මුල හේතූන්වලට ආමන්ත්‍රණය කිරීම වෙනුවෙන් ආයෝජනය කිරීම සඳහා මෙම අරමුදල උත්ප්‍රේරකයක් වනවා සේම අරමුදල් එක්රැස් කිරීමේ මාර්ගයක් ද වන්නේය.

- යහ පාලනය, ප්‍රජාතන්ත්‍රවාදය, මානව හිමිකම්, යුක්තිය, නීතියේ ආධිපත්‍යය ශක්තිමත් කිරීම සහ සැම සියලු දෙනාටම ආත්ම අභිමානයක් හිමිකර දීම තුළින් අප ජාතිය දිගු කාලීන සාමයක් හා සමෘද්ධියක් කරා මෙහෙයවීමේ දී ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ සහ අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතාගේ නායකත්වයෙන් යුතු ආණ්ඩුව සංහිඳියාව සහ සංවර්ධනය උදාකර ගැනීමේ දෙවැදෑරුම් න්‍යායපත්‍රයන්ට ප්‍රමුඛස්ථානයක් ලබා දීමට කටයුතු කළ අතර, ශ්‍රී ලංකාව වන මගේ මවු රට 2015 ජනවාරි මස පැවති ජනාධිපතිවරණයේ සිට මේ දක්වා සාමය ගොඩනැගීමේ සහාය කාර්යාලය සමඟ සහයෝගයෙන් සමීපව කටයුතු කරන්නට විය.

- එක්සත් ජාතීන්ගේ සාමය ගොඩනැගීමේ අරමුදලෙන් සහාය ලබා ගැනීමට සුදුසු රටක් ලෙස ශ්‍රී ලංකාව නම් කිරීමට පසුගිය වසරේ දී මහලේකම්වරයා පියවර ගත්තේය.

- දශක තුනක් තිස්සේ පැවති අරගලවලින් මිදී යළි නැගී සිටීමට, සංහිඳියාව ඇති කරගැනීමට සහ අරගල යළි ඇති නොවීමට වගබලා ගැනීමට අපේක්ෂා කරන ජාතියක් වශයෙන් අපි, උපකාර අත්‍යාවශ්‍ය වූ අප වැනි තවත් බොහෝ රටවල් මෙන් මෙම අරමුදලේ වටිනාකම හොඳින් අවබෝධ කරගෙන සිටිමු.

- අපි සියලු දෙනාම, එනම් එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සියලුම සාමාජිකයෝ, පසුගිය සැප්තැම්බරයේ 2030 න්‍යාය පත්‍රය සම්මත කර ගැනීම සඳහා අත්වැල් බැඳ ගත්හ. දරිද්‍රතාවය අවසන් කිරීමටත්, අපගේ පෘථිවිය ආරක්ෂා කිරීමටත්, සාමකාමී, සාධාරණ හා සර්වග්‍රාහී සමාජයක් ප්‍රවර්ධනය කිරීමටත් අරමුණු කර ඇති 2030 න්‍යාය පත්‍රය, සාමය තිරසාර බවට පත් කිරීමේ න්‍යාය සමඟ අන්‍යෝන්‍ය ලෙස බැඳී පවතී. ප්‍රචණ්ඩකාරී අරගලය, මනුෂ්‍ය ප්‍රජාව වෙනුවෙන් වූ අපගේ යහපත් අභිමතාර්ථයන් ඉටු කර ගැනීමට බාධකයකි. එනිසා වඩාත් වැදගත් වන්නේ එය වළක්වා ගැනීමයි. එසේ හෙයින්, අරගල හටගැනීම වළක්වාලීමටත් සියලු දෙනාගේම යහපත වෙනුවෙන් අරගල වළක්වාලීම හා නැවත ඇති නොවීම සඳහා ආයෝජනය කිරීමටත් ලෝක ප්‍රජාවගේ අවධානය යොමු කිරීමට දැන් කාලය එළඹ ඇත.

- මේ වන විට රටවල් 27ක ව්‍යාපෘති 200 කට වඩා සහාය ලබා දෙන එක්සත් ජාතීන්ගේ සාමය ගොඩනැගීමේ අරමුදල, අරගල වළක්වාලීමේ හා සාම සාධක කටයුතුවලට මැදිහත් වන එක්සත් ජාතීන්ගේ සංවිධානයට අයත් ආයතනවලට කඩිනම් හා නම්‍යශීලී ලෙසත් අවදානම්වලට මුහුණ දිය හැකි ලෙසත් අරමුදල් සම්පාදනය කිරීමේ ක්‍රමවේදයකි.

- පසුගිය වසරේ ජනවාරි මස සිදු වූ දේශපාලනමය සංක්‍රාන්තිය අපට ඉතා වැදගත් සාම සාධක අවස්ථා උදා කර දුන්නක් විය. අපගේ ජනතාව අතර විශ්වාසය හා විශ්වසනීයත්වය ගොඩනැංවීමෙහි ලා අවශ්‍ය පියවර ගැනීමට ප්‍රමුඛත්වය ලබා දෙමින්, ජාතික සංහිඳියාව ප්‍රවර්ධනය කිරීම අපගේ අරමුණයි.

- සිවිල් සමාජය හා රාජ්‍ය නියෝජිතායතන සඳහා කටයුතු කරමින්, ප්‍රතිසංවිධානය, සංක්‍රාන්තික යුක්තිය, යහපාලනය හා නැවත පදිංචි කරවීම හා කල්පවත්නා විසඳුම් ලබා දීම යන ක්ෂේත්‍රයන්ට අදාළව, ශ්‍රී ලංකාවේ සාමය ගොඩනැංවීම පිණිස ප්‍රමුඛත්වය ලබා දිය යුතු අංශ අප විසින් හඳුනාගෙන ඇත. දැනටමත්, ළඟදී මුදා හරින ලද ඉඩම්වල 7000 ක් පමණ වූ ජනතාව නැවත පදිංචි කිරීම සඳහා මෙම අරමුදල අපට උපකාර කර ඇත.

- අප රටෙහි ස්ථාපනය කරන ලද ප්‍රතිසන්ධාන යාන්ත්‍රණ සම්බන්ධයෙන් රටේ සියලු පාර්ශ්වයන් සමඟ පුළුල් සාකච්ඡා පවත්වා ගෙන යාමට අරමුදල අපට සහාය ලබා දෙයි. මෙය විශ්වාසය හා විශ්වසනීයත්වය ගොඩනැංවීමට උපකාරීවන, ප්‍රතිසන්ධාන ක්‍රියාවලියේ ප්‍රධාන අංගයක් බව ඔබටද අවබෝධ වනු ඇත.

- අපට අඩු පාඩුවක්ව පවතින, මිල කළ නොහැකි තාක්ෂණික විශේෂඥභාවය කඩිනමින් ලබා ගැනීමටද, ජාතික සමගි හා ප්‍රතිසන්ධාන කාර්යාලය හරහා ප්‍රතිසන්ධානය අරමුණු ගරගත් ව්‍යාපෘති ක්‍රියාවට නැංවීමට ද අරමුදල අපට උපකාර කරයි.

- අරමුදල් හා තාක්ෂණික විශේෂඥභාවය ලබාදීම තුළින් මැදිහත්වීම ගැටුම් වැළැක්වීමෙහිලා අතිශයින්ම වැදගත්වේ. සාමය ගොඩනැගීමට අනුගාමීව සැමවිටම ගැටුම් ඇතිවිය යුතු නොවේ. එහිදී වැඩිම අවධානය යොමුවිය යුතු වන්නේ භීෂණය මගින් සමාජයන් විනාශ වී හේස භින්න වීමට පෙර ගැටුම් වැළැක්වීම කෙරෙහි අවධානය යොමුවීමයි.

- ලොව පුරා මෙවැනි ව්‍යාපාරවලට ආධාර කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ සාමය ගොඩ නැගීමේ අරමුදල තර කළ යුතු වේ.

- එක්සත් ජාතීන්ගේ මහා සම්මේලනය සහ ආරක්ෂක මණ්ඩලය විසින් තහවුරු කරන ලද එක්සත් ජාතීන්ගේ සාමය ගොඩනැගීමේ ව්‍යුහයේ 2015 සමාලෝචනය මගින් සාධාරණව හඳුනා ගනු ලැබ ඇති එක්සත් ජාතීන්ගේ සාමය ගොඩනැගීමේ කටයුතු සඳහා දුර දක්නා පරිදි, තිරසාරව, ප්‍රමාණවත් අරමුදල් ලබාදීම අතිශයින්ම වැදගත් වේ.

- මෙම තත්ත්වය යටතේ, අරගල වළක්වා තිරසාර සාමයක් ගොඩනැගීමට අවශ්‍ය ශක්තිය ලබා දෙන එක්සත් ජාතීන්ගේ සාමය ගොඩනැගීමේ අරමුදල දායක මුදල් අඩුවීම හේතු කොටගෙන ගැටළුවලට මුහුණ පෑම, සංවේගජනක කාරණයකි.

- එහෙයින් අපගේ ජාතික අත්දැකීම් ද කෙටියෙන් ඔබ සමඟ බෙදා හදා ගනිමින්, මෙම සමුළුවේ සම- සත්කාරකයින් හා සාමය ගොඩනැගීමේ සහාය කාර්යාලය සමඟ එක්ව මම ද සාමාජික රාජ්‍යයන්ගෙන් ඉල්ලා සිටින්නේ මෙම වැදගත් අරමුදලට ලබා දෙන දායකත්වය වැඩි කරන ලෙසය.